# මානව වර්ගයා ගැන නැවත සිතන්නට
## ලොවම පොලඹවන නවසීලන්තයේ ඛේදවාචකය

ශානක ලියනගම



නෙදර්ලන්තය යුරෝපයේ සාමකාමී රටක් ලෙස පිළිගනු ලබනවා. ප්‍රංශය, ජර්මනිය හා බෙල්ජියමෙන් පසුගිය කාලයේ වාර්තා වූ ත්‍රස්තවාදී ක්‍රියා කිසිවක් එරටින් වාර්තා වී තිබුණේ නැහැ. අනෙකුත් යුරෝපීය රටවලට සාපේක්ෂව නෙදර්ලන්තයේ නීත්‍යානුකූල ගිනිඅවි දරන්නන්ගේ ප්‍රතිශතය පහළම අගයක් ගන්නවා. කෙසේ නමුත් ලෝකයක් මොහොතකට සලිත කළ නවසීලන්තයේ ක්‍රයිස්ට්චර්ච් ප්‍රහාරයට දින තුනකට පසු පැරණි ඕලන්ද නගරයක් වූ යුට්‍රැක්ට් නගරයෙනුත් ඊට ආසන්න සිදුවීමක් වාර්තා වුණා. ධාවනය වූ ට්‍රෑම් රථයක් ඉලක්කකර එල්ල වූ වෙඩි ප්‍රහාරයකින් තිදෙනකු මියගොස් නව දෙනකුට පමණ තුවාල සිදුවුණා. ඝාතකයා ගොක්මන් ටානිෂ් නම් 37 හැවිරිදි තුර්කි සංක්‍රමණිකයකු බවට පසුව හඳුනා ගැනුනා. මෙම ලිපිය ලියන මොහොත වනවිට පැවති තත්ත්වය අනුව ප්‍රහාරකයාගේ අරමුණ කුමක් දැයි පැහැදිලි නැහැ. ඔහුගේ ක්‍රියාව යම් අන්තවාදී අරමුණකින් කළාද නැත හොත් පෞද්ගලික අරමුණකින් කළාද යන්න හරියටම පැවසිය නොහැකි බවට නෙදර්ලන්ත පොලිසිය පවසා තිබෙනවා. කලකට ඉහත දික්කසාද වූ ඔහුගේ බිරිඳ සමග වූ ආරවුලක් හේතුවෙන් මෙම වෙඩි තැබීම සිදුකරන්නට ඇති බවට වාර්තා පළ වුවත් එහි ඇති ත්‍රස්තවාදී ගතිකත්වය ප්‍රතික්ෂේප කළ නොහැකියි. නවසීලන්තයේ ක්‍රයිස්ට්චර්ච් සංහාරයේ වීඩියෝව උණු උණුවේ ලෝකය පුරා සංසරණය වීමත්, ආසන්නවම ඇතිවූ නෙදර්ලන්තයේ වෙඩි තැබීමත් හරහා බටහිර ලෝකය සියුම් තැති ගැන්මකට ලක්ව ඇතිබව පෙනී යනවා. නෙදර්ලන්තයේ ඇම්ස්ටර්ඩෑම්, ඩැන්හාග් හා රොටන්ඩෑම් යන ප්‍රධාන නගරවල ආරක්ෂාව තර කොට තිබෙනවා.

කෙසේ නමුත් පසුගිය සතියේ ලෝකයේම දැඩි අවධානය යොමුවුණේ නවසීලන්තයේ ක්‍රයිස්ට්චර්ච්හි ඉස්ලාම් දේවස්ථාන දෙකක් ආසන්නයේ සිදු කළ වෙඩි තැබීම්වලින් පුද්ගලයින් 50 දෙනකු ජීවිතක්ෂයට පත්වීමේ සිදුවීමටයි. මේ ප්‍රහාර වලින් තවත් 50 දෙනෙකු පමණ තුවාල ලැබුවා. වෙඩි ප්‍රහාරය එල්ල කළ ඔස්ට්‍රේලියානු ජාතිකයකු වන 28 හැවිරිදි බ්‍රෙන්ටන් ටැරන්ට් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ඝාතන සම්බන්ධයෙන් ඔහුට එරෙහිව චෝදනා ගොනු කෙරුණා. ඝාතකයාගේ සංවිධානාත්මක බව හා ඔහු විසින් එය සජීවී වීඩියෝවක් හරහා ලොව පුරා ප්‍රදර්ශනය වීමට කටයුතු කිරීම ලෝක ව්‍යාප්ත ත්‍රස්තවාදයේ සම්ප්‍රදායික ආකෘතීන්ට වෙනත්ම හැඩයක් එක්කර තිබෙනවා.

ක්‍රයිස්ට්චර්ච් ඛේදවාචකය පිළිබඳව කතා න්දරය උදෑසනින්ම අපේ රටටනම් ආවේ ආගම්වාදී ගෝත්‍රික මතවාදයන් එක්ක නොවෙයි. ඒ අපේ රටේ සමාජ මාධ්‍ය වල සැරිසරන තරුණයන්ගේ ක්‍රිකට් මේනියාවක් එක්ක. මුලින්ම බංග්ලාදේශ ක්‍රිකට් කණ්ඩායමට එල්ල වූ ප්‍රහාරයක් ලෙස තමයි ඒ ආරංචිය පැතිරී ගියේ. ''උද්දච්ච බංගලියන්ගේ නයා ඇරිල්ලට කෙළෝ ගැනීමක්'' වැනි වූ විනෝදාත්මක භාවයක් ඒ කථිකාවේ තිබුණා. ලාහෝරයේදී ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරයේදී මෙන් ''බංගලියන්ද නූලෙන් හරි බේරී ඇති බවක්ද'' ඒ සමගම වාර්තා වුණා. උන්දැලා ''ලක් බයි චාන්ස'' එහෙම බේරීම යහපත් නමුත් උන්ගේ ''ලොකු සීන්'' නිසා එවැනි ඉල්ලන් කෑමකට ලක්වෙන්නට ඇති බව තමයි ෆේස්බුක් ක්‍රිකට් ලෝලීන්ගේ බහුතර මතය වුණේ. බංගලියන් එක්ක තිබුණු ඒ ක්‍රීඩා ඇරියස් එක හැර වෙනත් කිසිදු ලේ රහක් සමාජ මාධ්‍යවල හොල්මන් කරන අපේ රටේ තරුණ සමාජය තුළ නොතිබූ බව ඔවුන්ට ගරුත්වයකුත් දෙමින් මෙහිදී සඳහන් කළ යුතුමයි. ඒ වන විට සිද්ධියේ සැබෑ ස්වරූපය හෙළිවී තිබුණේ නෑ. නමුත් තවත් හෝරාවකින් පමණ මේ ම්ලේච්ඡ ප්‍රහාරයේ ප්‍රචණ්ඩත්වය දැක ''අනේ අපොයි'' කියන තැනට ලෝකයම පත්වුණා. මිනිසා තාක්ෂණිකව කෙතරම් දියුණු වුවද එකී දියුණුවේ සෑම පැතිකඩක්ම නැවත සමාජීය හා සංස්කෘතික කියවීමකට ලක් කිරීම අනිවාර්යය බවට වූ සංවාදයක් ක්‍රයිස්ට්චර්ච් සංහාරයත් සමගම ලෝකය පුරා ගොඩනැඟී තිබෙනවා.

ඇත්තටම බ්‍රෙන්ටන් ටැරන්ට් නම් මිනීමරු නොසණ්ඩාලයාගේ ක්‍රියාව ලෝකයේ සිදුවූ මේ ආකාරයේ පළමු ඝාතනය නෙවෙයි. මෑත අතීතයේ එවැනි සංවේදී සිදුවීම් ගණනාවක් ලෝකයෙන් වාර්තා වුණා. වර්ෂ 2004 දී රුසියාවේ බෙස්ලාන්හි පාසලක් රියාද්-උස් සලිහීන් නම් ඉස්ලාම් අන්තවාදී කණ්ඩායාමක් විසින් ආක්‍රමණය කළා. ඔවුන්ගේ ඉල්ලීම වුණේ රුසියාවේ කුඩා ප්‍රාන්තයක් වූ චෙට්නියාවට නිදහස ලබා ගැනීම. එදින පාසලේ සිටි සිසුන්, ගුරුවරුන් ඇතුළු සියලු දෙනා ප්‍රාණ ඇපයට පත්වුණා. දින තුනකට පසු ජනාධිපති පුටින්ගේ නියෝග යෙන් රුසියානු හමුදා ඔවුන් මුදාගැනීමේ මෙහෙයුමක් ක්‍රියාත්මක කළා. වඩාත් අනුවේදනීය සිදුවීම වන්නේ මේ ක්‍රියාදාමයෙන් හය හතර නොදන්නා සිසුන් ඇතුළුව සිවිල් වැසියන් 334 දෙනෙකු මියයෑමයි. තවද, 2004 දී පාකිස්තානයේ පෙෂාවර්හි යුද හමුදා පාසලකට ඇතුළු වූ ටෙහිරික් තලේබාන් නම් ත්‍රස්තවාදී සංවිධානයක් විසින් මල් කැකුළු වන් ළමා ළපටින් ඇතුළුව 149ක පිරිසක් ඝාතනය කළා. දේශපාලන හා පෞද්ගලික හේතුමත පාසල්වල සිදුකරන ලද එවැනි ලේ වැගිරීම් සියයකට වැඩි ප්‍රමාණයක් පසුගිය දශක දෙකක කාලය තුළ ලෝකයෙන් වාර්තා වෙනවා. ඇමෙරිකා එක්සත් ජනපදයේ නීත්‍යානුකූල ගිනිඅවි ප්‍රමාණය එහි ජනගහනය ඉක්මවා යනවා. තමන්ගේම පාසලට පැන තම මිතුරන් වෙඩි තබා මරා දමන තරුණයන් පිළිබඳව පසුගිය දශකයේ ඕනෑතරම් වාර්තා වුණා. ප්‍රේම සම්බන්ධතා කඩවීම, සමාජයේ දැඩි අවධානය දිනා ගැනීම, පෞද්ගලික වෛරය ආදී හේතුමත ඇතිවූ මානසික ආතතීන් මේ කෙරෙහි බලපා තිබෙනවා. පසුව එවැනි සිදුවීම් අරභයා වූ චිත්‍රපට පවා නිර්මාණය වුණා. සම්මානත Elephant නම් හොලිවුඩ් චිත්‍රපටය මේ මොහොතේ සිහියට නැගෙනවා. හමුදා ඇඳුම් සහිතව පාසලට ඇතුළුවන තම මිතුරන් දෙදෙනා පිළිබඳව සැකයක් ඇතිවුවත් ඔවුන් මේ සා විනාශයක් කරාවි යැයි ඔහුගේ මිතුරන් හීනෙන්වත් සිතන්නේ නැහැ. පසුව ඔවුන් දෙදෙනා එක්ව පාසල පුරා යමින් සිසුන්ට වෙඩි තබනවා. හුදකලා ගොඩනැඟිලි අතරින් ඇසෙන කෑගැසීම් දෝංකාර දෙනවා. එම ඝාතනවල කැමරාව යොමුවන්නේ නිතරම වින්දිතයා වෙතයි. කෙතරම් සාහසික බවක් තිබුණද එය සිනමා නිර්මාණයක් පමණයි. නමුත් බ්‍රෙන්ටන්ගේ මිනිත්තු 17ක වීඩියෝවේ තිර රචනය, අධ්‍යක්ෂණය හා නිෂ්පාදනය ඔහුගේමයි. එහි ප්‍රධාන නළුවාත් ඔහුමයි. තම හිස්වැසුමේ සවිකරන ලද මයික්‍රෝ කැමරාවකින් පටිගත කළ සියල්ල සමාජ මාධ්‍ය හරහා සජීවීව විකාශය කිරීමට ඔහු කටයුතු කළා. සියල්ල සිදුවුණේ ත්‍රාසජනක හොලිවුඩ් චිත්‍රපටයක මෙන්. ඔහු මෙසේ කිරීමෙන් තම අන්තවාදී මතවාදයට ලෝකය පුරා උද්දීපනයක් ඇති කිරීමට උත්සාහ දරා ඇති බවක් පෙනී යනවා. වෙඩි තැබීම සිදුකිරීමට මොහොතකට පෙර බ්‍රෙන්ටන් විසින් පිටු 74ක ප්‍රකාශනයක් (Manifesto) අන්තර් ජාලය හරහා බෙදාහැර තිබුණා. සංක්‍රමණික විරෝධී හා මුස්ලිම් විරෝධී මතවාදයන් හා තම තීරණයට හේතූන් ඔහු විසින් පෙළගස්වා තිබුණා. එම ප්‍රකාශනය අග්‍රාමාත්‍ය කාර්යාලයටත් ඔහු විසින්ම යොමුකර තිබුණා. දැඩි සුදු අන්තවාදී ප්‍රතිපත්තියක එල්බ සිටින බ්‍රෙන්ටන් උසාවියට යෑමට පෙර තම සාර්ථකත්වය පිළිබඳව අතින් සංඥාවක් කළා. තම ත්‍රස්තවාදී ෆැන්ටසිය අනුමත කරන රසික පිරිසක් සිටින බවට ඔහුට දැඩි විශ්වාසයක් ඇති බව එයින් පෙනී යනවා. බ්‍රෙන්ටන් ටැරන්ට්ට කිසිම මානසික අවපීඩනයක් හෝ පසුතැවීමක් නොමැති බවට පොලිසිය වාර්තාකර තිබෙනවා. නීති සහාය නොමැතිව උසාවියට තනිවම කරුණු කීමට පවා ඔහු ඉදිරිපත්ව තිබෙනවා.

සුදු අන්තවාදය (White Supremacy) ලෝකයට අලුත් දෙයක් නොවෙයි. සුදු ජාතිකයන් අන් සියලු ජාතීන්ට වඩා උසස් බවත් හැමවිටම ඔවුන්ට ප්‍රමුඛත්වය ලැබිය යුතු බවට වූ මතවාදය 17 වැනි සියවස දක්වා ඈතට විහිදෙනවා. කිසිදු විද්‍යාත්මක හේතුවක් නැති මේ මනෝරාජික ආකල්පය යුරෝපයේ කාර්මික විප්ලවයේ සාර්ථකත්වයත් සමග වර්ධනය වුණා. එය සුදු ජාතිකයන් වෙසෙන කලාපවල විවිධ වේශයෙන් ක්‍රියාත්මකව පැවතුණා. යුරෝපීය රටවලට අයත් වූ යටත් විජිත පවත්වා ගැනීම, ඇමෙරිකානු වහල් මෙහෙය ආදී ක්‍රියාවලි තුළින් මෙම White Supremacy මතවාදයේ සැබෑ ස්වරූපය හඳුනාගත හැකියි. සුදු අන්තවාදයේම දිගුවක් ලෙසින් විසිවැනි සියවසේ මුල් යුගයේ පැමිණි නට්සිවාදය ලෝක ඉතිහාසය උඩු යටිකුරු

43 වන පිටට